**28-03-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, හැම කෙනෙකුගේම පාපයන් උරාගන්නා හොඳම කඩදාසිය ශිව බාබා පමණි. ඔහු සිහි කළ විට ඔබේ පාප දුරු වී යයි.

**ප්‍රශ්නය:** ජීවාත්ම සත්තාවේ තදින්ම බැඳෙන කිලුට කුමක්ද? ඒවා මකා දැමීමට ඔබට අවශ්‍ය උත්සාහය කුමක්ද?

**පිළිතුර:** ජීවාත්ම සත්තා මත ඇත්තේ ඉතා ගැඹුරු ශරීර අවධානයේ කිලුටුය. ජීවාත්ම සත්තාවන් නැවත නැවතත් කෙනෙක්ගේ නමටත් ස්වරූපයටත් හසු වේ. ජීවාත්ම සත්තාවන් පරමාත්ම පියා සිහිකරන නමුත් දිගටම ශාරීරික අයද සිහි කරයි. ඔවුන් දිගින් දිගටම එකිනෙකාගේ හදවත් වල දුකට හේතු වේ. මෙම කිලුට මකා දැමීම සඳහා, ජීවාත්ම සත්තා විඥාණයට පැමිණීමට උත්සාහ කරන්න.

**ගීතය:** ඔබේ හදවත් දර්පනය තුළින් මුහුණ දෙස බලන්න..!

ඕම් ශාන්ති. සියලු මධ්‍යස්ථාන වල සුමිහිරි දරුවන් ගීතය ඇසුවා. ඔබම ඔබ දෙස බලා කොපමණ පිංකර ඇත්ද සහ පාප කොතරම් ප්‍රමාණයක් මකා ඇත්දැයි බලන්න. මුණිවරුන් හා ශුද්ධවන්තයින් අතුළු මුළු ලොවම මෙසේ කැගසයි. පාරිශුද්ධ කරුවාණනි කියා අඬගසයි. අපිරිසිදු අය පිරිසිදු කරන්නේ එකම පරම පියා පමණි. අන් සැම තුළ පාප ඇත. ඔබ දන්නවා පාප ඇත්තේ ජීවාත්ම සත්තාවේ බව. පිංද එකතු වන්නේ ජීවාත්ම සත්තාව තුළයි. පිරිසිදු බවට පත්වන්නේද අපිරිසිදු බවට පත්වන්නේද ජීවාත්ම සත්තාවයි. එම පාප අස් කළ හැක්කේ කෙසේද? මේ සියලු ජීවාත්ම සත්තාවන් අපිරිසිදුය. ඒවා පාප කිලිටෙන් වැසී ඇති අතර පාපීන් යැයි කියන්නේ ඒ නිසාය. තෙල් හෝ තීන්ත ඉහිරුණු විට උරා ගන්නා කඩදාසි භාවිත කරයි. සියලුම මනුෂ්‍යයින් එම එකම කෙනා සිහිකරන්නේ ඔහු වූ කලී පාරිශුද්ධකරුවාණන් වන උරාගන්නා කඩදාසිය නිසාය. ඔහු හැර වෙන කිසිවෙක් එසේ නොවේ. ඒ මිනිසුන් උපතෙන් උපතම ගංගා නම් ගඟේ නාමින් වඩාත් අපිරිසිදු වූහ. අපිරිසිදු අය පිරිසිදු කරන උරාගන්නා කඩදාසිය ශිව බාබාම පමණි. ඔහු වූ කලී ඉතාම කුඩා ලක්ෂ්‍යයක්, තිතක් ම පමණි. ඔහු හැම කෙනෙකුගේම පාප දුරු කරයි. කුමනාකාර ක්‍රමයකින්ද? ඔහු සරළව මෙසේ කියයි මා, එනම්, උරාගන්නා කඩදාසිය සිහිකරන්න! අර්ථසම්පන්න කෙනා මාය. මා ඔබට වෙනත් කරදරයක් නොකරමි. ඔබ ද ලක්ෂ්‍යයකි, මා ද ලක්ෂ්‍යයකි, ජීවාත්ම සත්තාවකි. ඔහු මෙසේ කියයි මා සිහිකළ විට ඔබේ පාප මැකී යයි. දැන්, ඔබ හැම කෙනෙක්ම ඔබේ හදවතින් මෙසේ අසන්න. සිහිකිරීම තුළින් කොපමණ පාප ප්‍රමාණයක් මැකී ගොස් ඇත්ද? මා කොපමණ පාප කර ඇත්ද? තව කොතරම් කිළිටු ඉතිරිව ඇත්ද? ඔබ මෙය දැනගන්නේ කෙසේද? මේ උරාගන්නා කඩදාසිය නම් වූ කෙනා සිහිකිරීමේ මාර්ගය අන් අයටත් දිගටම පෙන්වා දෙන්න. හැම කෙනෙකුටම මෙම උපදෙස දීම ඉතා හොඳය. මේ උපදෙස ලැබුණ අය පරම පියා සිහිකරන අතර ඒ උපදෙස ලබා දෙන අය ඔහු සිහි නොකිරීමද විශ්මයජනකය. එම නිසයි ඔවුන්ගේ පාප කැපී නොයන්නේ. ඔබ ඔහුව සිහිකළ යුතුමයි. අන් අයටද මෙම මාර්ගය කියා දෙන්න! අන් අයට විස්තර කර දුන් තරමට ඔබට ද යහපත සිදුවෙයි. මෙම කාර්යයේ යෙදෙන්න. අන් අයටද කියන්න. පරම පියා සිහිකළ විට ඔබ පුණ්‍යවන්ත ජීවාත්ම සත්තාවක් බවට පත් වේ. ඔබේ යුතුකම වන්නේ අන් අයට මේ ඔබේ එකම පාරිශුද්ධකරුවාණන් බව කීමයි. ඥාන ගංගා කොතෙක් තිබුණත්, ඔබ හැම කෙනෙකුටම කිව යුත්තේ එකම කෙනා සිහි කරන ලෙසයි. පාරිශුද්ධකරුවාණන් වන්නේ ඔහුම පමණි. ඔහු ගැන බොහෝ ප්‍රශංසා ඇත. ඔහු ඥාන සාගරයද වෙයි. එකම පරම පියා සිහි කරමින් ජීවාත්ම සත්තා විඥාණයේ සිටීම එකම දුෂ්කර කාර්යයයි. පරම පියා මෙය කියන්නේ ඔබට පමණක් නොවේ සියලුම මධ්‍යස්ථානවල දරුවන් ඔහුගේ සිතට එයි. පරම පියා සියලුම දරුවන් දකී. ඔහුගේ ඉතා හොඳ සේවාධාරී දරුවන් සිටින ශිව බාබාගේ පුෂ්ප උද්‍යාන ඇත. බාබා සිහිකරන්නේ හොඳ මල් වතුවල සිටින අයයි. ධනවතෙකුට දරුවන් හතර පස් දෙනෙක් සිටින විට, ඔහු ලොකුම පුතා සිහිකරයි. මල් විවිධය. ඉතින් බාබා සිහි කරන්නේ වඩා විශාල වතුය. හැම කෙනෙකුටම මේ මාර්ගය පහසුවෙන් පෙන්වාදිය හැකියි. ශිව බාබා සිහිකරන්න. පාරිශුද්ධකරුවාණන් ඔහුම පමණි. ඔහුම මෙසේ කියයි මාව සිහිකිරීමෙන් ඔබේ පාප පිළිස්සී යයි. ඔහු මුළු ලෝකයටම ඒ තරමම හොඳ ප්‍රථම පංතියේ උරාගන්නා කඩදාසියකි. හැම කෙනෙක්ම ඔහු සිහිකරයි. ඕනම කෙනෙකුට මෙම මාර්ගය කියා දීම පහසුය. ශිව බාබා සිහිකරන්න! පරම පියා ඔහුව සිහිකිරීමේ මාර්ගය ඔබට පෙන්වා දී ඇත්තේ ඔබ වැසී ඇති ශරීර

අවධානය නම් වූ කිලුට මැකී යන ආකාරයෙනි. ජීවාත්ම සත්තා විඥාණයට පැමිණීමට උත්සාහය අවශ්‍යය. කිසිවෙක් බාබාට ඇත්ත කියන්නේ නැත. සමහරු වගු සටහනක් බාබාට යැවූ පසු වෙහෙසට පත්වේ. අවසාන ඉලක්කය ඉතා ඉහළය. මායා ඔවුන්ගේ කුල්මත්භාවය කඩාබිඳ දැමූ පසු ඔවුන් ලිවීම නවතයි. චක්‍ර භාගයකම ශරීර අවධානය හලා දැමිය නොහැකිය. පරම පියා මෙසේ කියයි මෙම කාර්යය දිගටම කරගෙන යන්න. බාබා සිහිකරමින් අන් අයද එයට යොමුකරවන්න. එපමණයි! සියල්ලටම වඩා ඉහළම කාර්යය මෙයයි. ස්මෘතියේ නොසිටින අය මෙම කාර්යය නොකරයි. පියා ස්මරණය කිරීම යනු පාප පිළිස්සී යන යෝගා ගින්නයි. ඒ නිසයි ඔබෙන් අසන්නේ කොතරම් දුරට ඔබේ පාප පිළිස්සී ඇත්ද කියා. ඔබ පරම පියා සිහිකළ තරමට ඔබේ සතුටේ රසදිය කඳ ද ඉහළ තිබේ. ඔබ හැම කෙනෙක්ම ඔබේ හදවත දනී. අන් අයගේ හදවත් ද ඔවුන් කරන සේවය මඟින් දත හැකිය. ඔබ අන් අයට බාබා සිහිකරන මාර්ගය කියා දෙයි. ඔහු පාරිශුද්ධකරුවාණන්ය. මෙහි ඇත්තේ අපිරිසිඳු තමෝප්‍රධාන් ලෝකයයි. සියලුම ජීව සත්තාවන් සහ ඔවුන්ගේ ශරීර තමෝප්‍රධාන්ය. ඔබ දැන් ආපසු ගෙදර යා යුතුය. එහි දී, සියලුම ජීව සත්තාවන් පිරිසිඳුව සිටී. පිරිසිඳු වූ විට පමණයි ඔවුන්ට ආපසු ගෙදර යා හැක්කේ. ඔබ අන් අයට ද මෙම මාර්ගය පෙන්විය යුතුයි. පරම පියා ඔබට හොඳ ක්‍රමයක් කියා දෙයි. ශිව බාබා සිහිකරන්න! මේ උරාගන්නා කඩදාසි භාවිත කර ඔබේ පාප අස්කළ විට ඔබේ පාප ක්‍රියා දුරු වී යයි. වැදගත් ම දෙය පාරිශුද්ධියට පත් වීමයි. මනුෂ්‍යයින් අපිරිසිඳු බවට පත්වීම නිසයි ඔවුන් මෙසේ අඬගසන්නේ පාරිශුද්ධකරුවාණනි, පැමිණෙන්න! පැමිණ හැම කෙනෙක්ම පිරිසිඳු කර අප සැම ආපසු ඔබ සමඟම ගෙන යන්න. ලියවී ඇත්තේ ඔහු සියලුම ජීවාත්ම සත්තාවන් පිරිසිඳු කර ආපසු ගෙදර රැගෙන යන්නේ එකම අපිරිසිඳු ජීවාත්ම සත්තාවක්වත් ඉතිරි නොවන ලෙසයි. තවද, මුලින්ම දෙව්ලොව වැසියන් එන බව විස්තර කර ඇත. පරම පියා දෙන ඖෂධය සෑම කෙනෙකුටම ලබා දෙයි. ඔබට මුණගැසෙන සෑම කෙනෙකුටම මෙම ඖෂධය දෙන්න. ඔබ පරම පියා වෙත යෑම අපේක්ෂා කරන නමුත් ඔබ ජීවාත්ම සත්තාවන් අපිරිසිඳු නිසා, ඔබට ආපසු යා නොහැකියි. පාරිශුද්ධත්වයට පත් වූ විට එහි යා හැකිය. ජීවාත්ම සත්තාවණි, මා සිහිකළ විට මා සමඟම ඔබ රැගෙන යමි. ඉන්පසු එතැනින්, ඔබ සතුට කරා යවමි. ඉනික්බිතිව ලෝකය වියපත් වන විට, ඔබට දුක ලැබේ. මා කිසිවෙකුට දුක නොදෙමි. ඔබ හැම කෙනෙක්ම ඔබම පරීක්ෂා කරගන්න. මා බාබාව සිහිකරනවාද? ඔබ ඔහුව සිහිකළ තරමට ඔබේ සතුටේ රසදිය කඳ ඉහළ නගිනු ඇත. මෙය එතරම්ම පහසු ඔසුවකි! මුණිවරු හෝ ශුද්ධවන්තයින් කිසිවෙක් මේ බෙහෙත ගැන නොදනී. එය කොහිවත් ලියවී නැත. මෙය සම්පූර්ණයෙන්ම අළුත් දෙයකි. පාප ගිණුම අයත් වන්නේ ශරීරයට නොවේ. සම්පූර්ණ කොටස වාර්තා වී ඇත්තේ එතරම්ම කුඩා ජීවාත්ම සත්තාවකය! ජීවාත්ම සත්තාවන් අපිරිසිඳු වන විට, එහි බලපෑමක් ජීවත් වන අය මත වැටේ. ජීවාත්ම සත්තාවන් පිරිසිඳු බවට පත් වූ විට ඔවුන්ට පිරිසිඳු ශරීර ලැබේ. සතුටට සහ අසතුටට පත් වන්නේ ජීවාත්ම සත්තාවන්ය. ශරීරයට හානි වූ විට, එහි වේදනා විඳින්නේ ජීවාත්ම සත්තාවයි. මෙසේ කියැවේ මෙයා අසතුටින් සිටින ජීවාත්ම සත්තාවක් අරයා සතුටින් සිටින ජීවාත්ම සත්තාවක්. එතරම් කුඩා ජීවාත්ම සත්තාවක් මෙවැනි කොටසක් රඟදැක්වීමද විශ්මය ජනකය. පරම පියා වූ කලී සතුට ලබා දෙන්නාය. මිනිසුන් ඔහු සිහිකරන්නේ ඒ නිසාය. දුක ලබා දෙන්නේ රාවණය. පළමුව එන්නේ ශරීර අවධානයයි. පරම පියා මෙසේ විස්තර කරයි ඔබ දැන් ජීවාත්ම සත්තා විඥාණයට පත් විය යුතුයි මේ සඳහා මහා උත්සාහයක් අවශ්‍යය. බාබා දන්නවා ඔබ ඉතා අමාරුවෙන් ඔහුව ඔබේ හදවතින්ම ඔබ කළ යුතු ලෙසින්ම සිහිකරන බවත්. මෙහි සිටිමින්ද ඔබ බොහෝ අය අමතක කරයි. ඔබ ජීවාත්ම සත්තා විඥානයේ සිටියා නම් පව් කරන්නේ නැත. පරම පියාගේ අණඥාව වන්නේ මෙයයි නරක නොඇසූ කන්ව සිටින්න! කලාවෙන් නිමවා ඇති ලෙස මෙය අදාල වන්නේ වඳුරන්ට නොව. දවස පුරාම ඕපාදූප දිගටම ඇදබාන අය සිටී. මෙය අදාල වන්නේ මනුෂ්‍යයින්ටය. මිනිසුන් වඳුරන් යොදවා ගන්නේ ඔවුන් වඳුරන් වගේ නිසාය. ඒ නිසා පරම පියාට මෙය විස්තර කිරීමට සිදු වී ඇත. සියලු මධ්‍යස්ථාන වල, ඇතැම් අය දිගටම එකිනෙකාට දුක දෙයි. පියා සිහිකරන හොඳ අයද සිටී. ඔවුන් සිතන්නේ ඔවුන් කිසිවෙකුට සිතින්, වචනයෙන් හෝ ක්‍රියාවෙන් දුක නොදිය යුතු බවයි. ඔබ කිසිවෙකුට වචනයෙන් හෝ දුකක් දුන්නොත් ඔබ මැරෙන්නේ දුකෙන්ය. පරම පියා මෙසේ කියයි ඔබ දරුවන් හැම කෙනෙකුටම සතුට දිය යුතුය. හැම කෙනෙකුටම මෙසේ කියන්න ජීව සත්තාමය විඥාණයෙන් සිටින්න! පියා සිහිකරන ගමන් මුදල් ගණුදෙනු ගැන කතා නොකරන්න. සරළ ලෙස ආදරණීය පරම පියා සිහිකර ඔබේ පාප පුළුස්සා දැමූ විට ඔබ ලෝකයේ හිමිකරුවන් බවට පත් වේ. පරමාත්ම දෙවියන් මෙසේ කියයි මන්මනභාව්! නිරතුරුවම මා පමණක් සිහිකරමින් ඔබේ උරුමයද සිහිකරන්න! මේ හැර වෙන කිසිවක් ඔබ අතරේ කතා නොකරන්න. පියා සිහිකර අන් අයට යහපතම සලසන්න! ඔබේ තත්ත්වය කොතරම් මිහිරි විය යුතුදැයි කිවහොත් මෙහි එන අය මෙසේ කිව යුතුයි බාබාගේ දරුවන් උරාගන්නා කඩදාසි වගේය. ඔබට දැන් ඒ තත්ත්වය නැහැ. කවුරු හරි බාබාගෙන් ඇහුවොත් එවිට උරාගන්නා

කඩදාසි කෙසේවෙතත් නිකන් කඩදාසි හෝ නොවෙයි ඔබ තාම. බාබා කතා කරන්නේ සියලු මධ්‍යස්ථාන වල දරුවන්ටයි. බොම්බේ, කල්කටා හා දිල්ලි ආදී සියලු මධ්‍යස්ථාන වල දරුවන්ටයි. ඇතැම් විට බාබාට මෙසේ වාර්තා ලැබෙනවා අහවල් ළමයා බොහෝ කරදර ඇති කරනවා. අන් අය පින්වත් දරුවන් කරවනවා වෙනුවට, ඔහු තව දුරටත් පාපකාරී ජීවාත්ම සත්තාවන් බවට පවා පත් කරවනවා. ඔහුගෙන් ඇසුවොත් බාබා සැනෙකින් කියාවි. ශිව බාබා හැම දෙයක්ම දනී. ඔහු ළඟ සියලු තොරතුරු ඇත. මේ බාබාටද කිව හැකියි. ඔබේ මුහුණින් හැම දෙයක්ම තේරුම් ගත හැකියි. මේ බාබා ද ස්මෘතියෙන් කුල්මත් වී සිටියි. ඔහුගේ මුහුණු දෙවි දේවතාවන්ගේ මෙන් උද්යෝගයෙන් හා සතුටින් තිබේ. ජීවාත්ම සත්තාව සතුටින් සිටින විට ශරීරය ද සතුටින් බව දැකිය හැකිය. ශරීරය දුක් විඳිනා විට වේදනාව දැනෙන්නේ ජීවාත්ම සත්තාවටයි. හැම කෙනෙකුටම එක දෙයක් දිගටම කියා දෙන්න. මෙසේ කියන්න එනම්, ශිව බාබා මෙසේ කියන බවයි. මා සිහිකර ඔබේ පව් දුරු කර ගන්න! ඔවුන් මෙසේ ලියා ඇත. ක්‍රිෂ්ණා දෙවියන් කතා කරයි. බොහෝ මිනිසුන් මා සිහිකළත් ඔවුන්ගේ පාප දුරුවෙන්නේ නැත. ඒ වෙනුවට ඔවුන් වඩාත් අපිරිසිඳු වෙයි. ඔවුන් දන්නේ නැහැ ඔවුන් සිහි කරන්නේ කවුද කියාවත්. ඔවුන් දෙවියන්ගේ ස්වරූපය දන්නේ නැහැ. දෙවියන් සර්වව්‍යාපී යැයි කියන විට ජීවාත්ම සත්තාව සේම පරමාත්මයත් එක වගේම තරුවක් වගේ වන්නේ ඔවුන් කියන්නේ ඒ දෙකම එක වගේ නිසා කියාය. එමනිසා, මෙසේ කියන විට, පරම පියා ද ලක්ෂ්‍යයකි, තිතකි. ඒ තරම්ම කුඩා ජීවාත්ම සත්තාවක් ශරීරයට ඇතුළු වේ. ඔහු සියලුම ලක්ෂ්‍යයන්ට මෙසේ කියයි දරුවනි, නිරන්තරව මා පමණක් සිහිකරන්න! ඔහු ඉන්ද්‍රියන් තුළින් කතා කරයි. ජීවාත්ම සත්තාවකට ඉන්ද්‍රියන් නොමැතිව ශබ්දයක් ඇති කළ නොහැකිය. ඔබට කිව හැකියි, ජීවාත්ම සත්තාවක ස්වරූපය සහ පරමාත්මයේ ස්වරූපයත් එක වගේම කියා, නේද? පරමාත්මය සහ ශිව ප්‍රතිමාව කියා හෝ එවැනි යමක් කිව නොහැක. පරම පියා මෙසේ කියයි මා ලක්ෂ්‍යයක් ම වුවත් මා පාරිශුද්ධකරුවාණන් වන අතර ඔබ ජීවාත්ම සත්තාවන් සැමදෙනා අපිරිසිඳුය. මෙය එතරම්ම සරළ කරුණකි! දැන් ජීවාත්ම සත්තා විඥාණයට පැමිණ පරම පියා වන මා සිහිකර අන් අයටද මාර්ගය පෙන්වා දෙන්න! මම ඔබට කියන්නේ මෙපමණයි මන්මනාභාව්! ඉන්පසු, අතු ඉති හා ශාඛා ගැන විස්තරයක් ඔබට ලබා දෙමි. පළමුව ඔබ සතෝප්‍රධාන් වන අතර පසුව සතෝ, රජෝ හා තමෝ තත්ත්වයන් පසු කරයි. පාපී ජීවාත්ම සත්තාවන් බවට පත් වූ කළ ඒ මත කිලිටු බොහෝය. ඒවා ඉවත් කරන්නේ කෙසේද? ඒ මිනිසුන් සිතන්නේ ගංගා නම් ගඟේ නෑමෙන් පව් සේදී යන බවයි. කොහොමනමුත්, ඒ ශරීරය නෑවීමයි. ජීවාත්ම සත්තාවකට පිරිසිඳු බවට පත් විය හැක්කේ පරම පියා සිහිකිරීමෙන් පමණි. මෙය හැඳින්වෙන්නේ ස්මෘති වන්දනා ගමන ලෙසයි. මෙය එතරම්ම සරළය. පරම පියා දිගටම සෑම දිනකම ඔබට මෙය විස්තර කරයි. ගීතාවේ ද ඔවුන් මෙසේ අවධාරණය කර ඇත. 'මන්මනාභාව්!' ඔබ නියතයෙන්ම උරුමය ලබන නමුත්, ඔබේ පාප මැකී යන්නේ මා සිහිකළ විට පමණි. පරම පියා වූ කලී අවිනාශී උරාගන්නා කඩදාසියයි. පරම පියා මෙසේ කියයි මා සිහිකිරීමෙන් ඔබ පිරිසිඳු බවට පත් වන අතර රාවණ් ඔබව අපිරසිඳු කරවයි. එමනිසා, ඔබ එවැනි පරම පියා සිහිකළ යුතුමයි. ඔබට සිතා ගත හැකියි එසේ බාබා සිහි නොකරන අයගේ තත්ත්වය ගැන. පරම පියා මෙසේ විස්තර කරයි දරුවනි, අන් හැම දෙයක්ම අතහැර දමන්න! සරළව එක දෙයක් සිහිපත් කරන්න ජීවාත්ම සත්තා විඥාණයට පැමිණ මා පමණක් සිහිපත් කරන්න! එපමණයි! ඔබ තේරුම් ගන්නවා, ජීවාත්ම සත්තාවක් ඔහුගේ ශරීරය අතහැර වෙන එකක් ගන්නා බව. සතුට සහ දුක අත්විඳින්නේ ජීවාත්ම සත්තාවයි. එකිනෙකාගේ හදවත් කවදාවත් නොරිදවන්න. එකිනෙකාට සතුටම ලබා දෙන්න. ඔබේ කාර්යය මෙයයි. එකිනෙකාට දිගටම දුක ලබා දෙන අය බොහෝ ඇත. ඔවුන් එකිනෙකාගේ ශරීර වලට බැඳී සිටී. ඔවුන් දිගටම එකිනෙකාගේ ශරීරය දවස පුරාම සිහිකරයි. මායා ඉතා දක්ෂයි. බාබා, නම් සඳහන් නොකරයි. ඒ නිසයි බාබා මෙසේ කියන්නේ දරුවනි, ජීවාත්ම සත්තා විඥාණය ලබන්න! ඥානය ඉතා පහසුයි. ස්මෘතියයි අපහසු. ඔවුන් අනිත් ඥානයන් ගැන විෂයන් අවුරුදු 15-20 හදාරයි. මෙම ඥානය ඉතා පහසුය. නාටකය ගැන දැන ගැනීම කතාන්තරයක් වැනිය. මුරලි පාඩම ද ඒ තරම් ලොකු දෙයක් නොවේ. බොහෝ අපහසුතා තිබෙන්නේ ස්මෘතියටයි. එවිට බාබා මෙසේ කියයි නාටකය! මොනවා වුණත්, දිගටම උත්සාහ කරන්න. පරම පියා සිහිකර ඔබේ පව් ස්මෘති ගින්නේ පුළුස්සා දමන්න. සමහර හොඳ දරුවන් මෙයින් අසමත් වෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. කිසිවිටෙක කිසිවෙකුගේ හදවත නොරිදවන්න. හැම කෙනෙකුටම සතුට දෙන්න. එකම පරම පියාගේ ස්මෘතියේ සිටිමින් අන් අයටද ඔහු ගැන සිහිකර දෙන්න.
2. පාප කිලිටු මකා දැමීම සඳහා, ජීව සත්තාමය විඥාණයට පැමිණ අවිනාශී උරාගන්නා කඩදාසිය වන පරම පියා සිහිකරන්න. ඔබේ තත්ත්වය සුම්හිරි එකක් කරගෙන දිගටම සෑම කෙනෙකුටම යහපත සලසන්න.

**වරදානය:** ඔබ ශක්තියේ ප්‍රතිමූර්තියක් වී, ඔබගේ ශ්‍රේෂ්ඨත්වයෙන් නවතාවයේ දජය ඔසවන්න.

දැන් කාලයේ සමීපත්වයට අනුව, ඔබගේ ශක්ති ස්වරූපයෙන් ඔබ අන් අය මත බලපෑමක් ඇති කළ විට, එවිට ඔබට අවසන් හෙලිදරව්ව තව සමීපයට ගෙන ඒමට හැකි වෙයි. ඔබ සෙනෙහස සහ සහයෝගය හෙලිදරව් කර ඇති ලෙසින්ම ඔබ සිදු කරන සේවයේ කැඩපතින් ඔබගේ ශක්ති ස්වරූපයේ අත්දැකීම ලබා දෙන්න. ඔබගේ ශ්‍රේෂ්ඨත්වය තුලින් ඔබගේ ශක්ති ස්වරූපයේ නවතාවයේ දජය ඔබ ඔසවන විට, හෙලිදරව්ව සිදු වෙයි. ඔබගේ ශක්ති ස්වරූපයෙන් සර්ව බලධාරී පියාගේ දර්ශනයක් ලබා දෙන්න.

**පාඨය:** ඔබගේ මනසින් බල දන් දීම සහ ඔබගේ ක්‍රියා තුලින් ගුණධර්ම දන් දීම, මහා දානයන්ය.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබගේ විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් කරගෙන නිරන්තරයෙන් නොබියව සහ සැහැල්ලුවෙන් රැදී සිටින්න.**

පරම පියා තුල ඔය දරුවන් කෙරෙහි පූර්ණ විශ්වාසය තිබේ: ඔබ බාධක විනාශ කරන්නන් වන මගේ දරුවන්ය, වන්දනීය ජීවාත්මයි; ඔය දරුවන් පියාට වඩා ඉදිරියෙන් සිටියි. ඔබ පියාව සැහැල්ලුවට පත් කරන උපකරණයි, එමෙන්ම ඔය සෑම කෙනෙක්ම සෑම වීටම ශුභ පුවත් ගෙන එන විශේෂ ජීවාත්මයි. ඔබ මෙම අවධානයේ ප්‍රතිමූර්තියක් වන සේ එවන් විශ්වාසයක් තමන් පිලිබදව ඇති කරගන්න, එවිට ඔබ ජයග්‍රහණය කරයි.